උපදෙස් ලිපි : ස.සේ.කො. 2025/01

මගේ අංකය: ස.සේ.කො.1/විනය පොදු
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ),
දෙවන මහල,නව පළාත් සභා ගොඩනැගිල්ල,
කුරුණෑගල.
2025.04.16

වයඹ පළාතේ සියලුම සමුපකාර සමිති,
සංගම් හා මණ්ඩලවල,
ගරු සභාපති/සාමාන්‍යාධිකාරී/කළමනාකරු.

## <u>විනයානුකූල පරීක්ෂණ සඳහා ගෙවීම් විධිමත්කිරීම</u>

ස.සේ.කො. රෙගුලාසි මාලාවේ 81 වගන්තිය ප්‍රකාරව සමුපකාර සමිතියක අධ්‍යක්ෂ මණ්ඩලය/ කාරක සභාව විසින් සේවකයෙකුට විරුද්ධව විනය පරීක්ෂණයක් පවත්වන අවස්ථාවකදී විනය පරීක්ෂණ නිලධාරියාගේ වාර්තා පදනම් කොට අප්‍රමාදව සේවකයා සම්බන්ධයෙන් තීරණයක් ගත යුතු වේ. එහෙත් මෙම කොමිෂන් සභාවට ලැබෙන වාර්තා හා තොරතුරු වලට අනුව ඇතැම් සේවකයින්ට විරුද්ධව පවත්වන විනය පරීක්ෂණ සම්බන්ධයෙන් පහත සඳහන් කාරණා කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර ඇත.

- ඇතැම් විනය පරීක්ෂණ නිම කිරීම සඳහා වසර 3 හෝ 4 ක් වැනි කාලයක් ලබා ගෙන ඇති බව
- ඇතැම් විනය පරීක්ෂණ වාර්තාවල තීරණයක් ගැනීමට අවශ්‍ය වන නිගමන හෝ නිර්දේශ පැහැදිලිව දක්වා නොමැති බව
- විනය පරීක්ෂණ වාර්තාවල නිර්දේශ සේවකයා සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා ඵලදායී නොවන අවස්ථාවල නැවත පරීක්ෂණ පැවැත්වීම සඳහා සමිති විසින් ඉල්ලා සිටින බව
- සමහර විනය පරීක්ෂණ වාර්තා ඵලදයී නොවන නමුත් විශාල මුදලක් සමිති විසින් ඒ සඳහා වැය කර ඇති බව
- සමහර අවස්ථාවල විනය ක්‍රියා මාර්ගයට හේතුවී ඇති මූල්‍යමය පාඩුව ඉතා සුලු නමුත් සමිතිය විසින් විනය පරීක්ෂණ නිලධාරී ගාස්තු වශයෙන් විශාල මුදලක් වැය කර ඇති බව.

02. එසේම ප්‍රමාද වී විනය පරීක්ෂණ වාර්තා භාර දී ඇති අවස්ථාවක අභියාචනා පරීක්ෂණ ඉල්ලුම් කළ හොත් තවදුරටත් සමිතිය විසින් වැය බර දැරිය යුතුවාක් මෙන්ම අදාල නිලධාරියා නැවත සේවයට කැඳවන තෙක් හෝ සේවයෙන් පහකර ඇති ඇතැම් අවස්ථාවල නව බඳවා ගැනීම් සිදු කරන තෙක් වැඩ බැලීම සඳහා ගෙවීම් කිරීමට සිදුවීමද සමිතිවලට වැය බරක් වේ.

03. මෙම තත්ත්වය සමාලෝචනය කිරීමේදී කොමිෂන් සභාවේ නිගමනය වන්නේ විනය පරීක්ෂණ පවත්වනු ලබන එක් එක් දිනවලදී අදාල ගෙවීම් සිදු කිරීම හේතුවෙන් පරීක්ෂණ නිලධාරීන් විසින් විනය පරීක්ෂණ කෙටි කාලයක් තුලදී නිම කිරීමට උනන්දු නොවන බව සහ අවසාන වාර්තා සහ ඒ සඳහා කරනු ලබන ගෙවීම එතරම් වැදගත් සේ සලකා කටයුතු කර නොමැති බවයි.

04. ඒ අනුව විනය පරීක්ෂණ පැවැත්වෙන අතරතුර එදිනෙදා ගාස්තු ගෙවීම වෙනුවට විධිමත් පරීක්ෂණ වාර්තා භාරදීමෙන් පසුව පමණක් ස.සේ.කො. 04/2019 හි සඳහන් ගාස්තු, පරීක්ෂණ පැවැත්වූ සම්පූර්ණ දින ගණන පදනම් කරගෙන එකවර ගෙවීමට කටයුතු කිරීමෙන් ඉහත සඳහන් කරන ලද දුර්වලතා මගහරවා ගැනීමට හැකියාව පවතින බවත් ඒ අනුව කටයුතු කරන ලෙසත් සමිතිවලට දැනුම් දීමට නියෝග කරනු ලැබේ.

කොමිෂන් සභා නියමය පරිදි,

එන්.වී.සෙනෙවිරත්න,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ).